# වෙළඳපොළට රජය මැදිහත් වන ආකාරය විමර්ශනය කරයි

ජී. කේ. නිරෝෂා දීපානි
ර/ බල/ මැද්දෙකන්ද මහා විද්‍යාලය - බලංගොඩ




තාක්ෂණ සහය පරිගණක සම්පත් මධ්‍යස්ථානය කුරුවිට

# 3.1. වෙළඳපොළට රජය මැදිහත් වන ආකාරය විග්‍රහ කරයි

**වෙළඳපොළට රජය මැදිහත් වන ආකාරය**

- ඉල්ලුම් සැපයුම් බලවේග මගින් තීරණය වන වෙළඳපොළ සමතුලිතය මගින් සමාජයක් තුළ භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ සහ බෙදාහැරීමෙහිලා කිසියම් ආකාරයක වැදගත් කාර්ය භාරයක් ඉටු කරයි.

- එසේ වුවද සමාජීය, දේශපාලන හා ආර්ථික දෘෂ්ටිකෝණවලින් බලා මෙම වෙළඳපොළ සමතුලිතය සමාජයට අහිතකර වේ යැයි යන විවිධ මත පළ කෙරේ.

- මේ නිසා නිදහස් වෙළඳපොළ ක්‍රියාකාරිත්වයට විවිධ ස්වරූපවලින් රජය මැදිහත් වනු දක්නට ලැබේ.

- මෙලෙස වෙළඳපොළට රජය මැදිහත් වන ආකාර

    - බදු පැනවීම
    - සහනාධාර ලබාදීම
    - මිල පාලනය
    - මිල ස්ථායීකරණය

- වෙළඳපොළ ක්‍රියාකාරිත්වයට ආණ්ඩුව මැදිහත් වන සුලභම ආකාරයක් වන්නේ නිෂ්පාදකයන්ගෙන් හා පාරිභෝගිකයන්ගෙන් බදු අය කිරීමයි.

❖ විවිධ අරමුණු ඇතිව ආණ්ඩුව බදු අය කිරිම් සිදු කරන අතර නිෂ්පාදනය හා පරිභෝජනය කරනු ලබන ඒකකයන් මත නිශ්චිත රුපියල් ප්‍රමාණයක බදු අය කිරීම හෝ භාණ්ඩයේ වටිනාකම මත කිසියම් ප්‍රතිශතයක් බදු වශයෙන් අය කිරීම හෝ ලෙසින් බදු අය කිරීමේ ස්වරූප දෙකක් දැකිය හැකිය.

❖ මෙලෙසින් බදු අය කිරිම් නිසා ඉල්ලුම්, සැපයුම් තත්ත්ව වෙනස් වන බැවින්, ඉල්ලුම් සැපයුම් බලවේග මගින් තීරණය වන වෙළඳපොළ සමතුලිතයෙහි වෙනස්කම් හට ගනී.

- බදු අය කරන්නා සේම රජය නිෂ්පාදකයන්ට හා පාරිභෝගිකයන්ට සහනාධාර දීමද සිදු කරයි.

- සහනාධාර දීම් නිසා ද ඉල්ලුම්, සැපයුම් තත්ත්ව වෙනස් වන බැවින්, ඉල්ලුම් සැපයුම් බලවේග මගින් තීරණය වන වෙළඳපොළ සමතුලිතයෙහි වෙනස්කම් හට ගනී.

- බදු අය කිරීම් හා සහනාධාර ලබාදීම් හැරුණු විට රජය මිල ප්‍රතිපත්ති මගින්ද, ඉල්ලුම් සැපයුම් බලවේග මගින් තීරණය වූ සමතුලිත අගයන් වෙනස් කරන අවස්ථා ද පවතී.

- මිල ප්‍රතිපත්ති යටතේ පාලනය කරන ලද මිල ගණන් හඳුන්වා දිම වර්තමානයේ විවිධ ආණ්ඩු විසින් අනුගමනය කරනු ලබන සුලභ ක්‍රියාමාර්ගයකි.

- එහිදි ආණ්ඩුව නීති මගින් මිල නියම කිරිමේ කාර්යයට අවතීර්ණ වීමක් සිදු කරන අතර ඒ නිසා වෙළඳපොළ යාන්ත්‍රණයේ ක්‍රියාකාරිත්වය නිෂ්ක්‍රීය වීමක් සිදුවේ.

- නීති මගින් ආණ්ඩුව නියම කරනු ලබන මෙවැනි මිල ප්‍රතිපත්ති ස්වරූප දෙකකි.
    - උපරිම මිල සීමා නියම කිරිම
    - අවම මිල සීමා නියම කිරීම

- නිෂ්පාදිත භාණ්ඩ වල මිල ගණන් නිරන්තරයෙන් උච්චාවචනය වනවිට ආර්ථිකය තුළ මිල අස්ථායීතාවයක් හටගනී. එවැනි මිල අස්ථායිතාවයක් අරමුණු කරගෙන ආණ්ඩු විසින් විවිධ මිල ස්ථායිකරණය ක්‍රියාමාර්ග ගනු ලැබේ.

## 3.2. වෙළඳපොළට රජය මැදිහත් වීම ඒකක බද්දක් ඇසුරෙන් විග්‍රහ කරයි.

- භාණ්ඩ මත බදු පනවන ආකාර නම් කරයි.
- ප්‍රතිශතක බද්ද අර්ථ දක්වයි.
- ඒකක බද්ද අර්ථ දක්වයි.
- සැපයුම්කරු මත ඒකක බද්දක් පැන වූ විට සැපයුම් වක්‍රයට වන බලපෑම පෙන්වයි.
- සැපයුම්කරු මත ඒකක බද්දක් පැන වූ විට වෙළඳපොළ සමතුලිතයට ඇතිවන බලපෑම ඉල්ලුම් හා සැපයුම් ලේඛනයක් ඇසුරින් පෙන්වයි.

- සැපයුම්කරු මත ඒකක බද්දක් පැන වූ විට වෙළඳපොළ සමතුලිතයට ඇතිවන බලපෑම ඉල්ලුම් හා සැපයුම් වක්‍ර ඇසුරින් පෙන්වයි.

- සැපයුම්කරු මත ඒකක බද්දක් පැන වූ විට වෙළඳපොළ සමතුලිතයට ඇතිවන බලපෑම ඉල්ලුම් හා සැපයුම් සමීකරණ ඇසුරින් පෙන්වයි.

- ඒකක බද්දක සුභසාධන ප්‍රතිවිපාකය විග්‍රහ කරයි.

- ගැනුම්කරු මත ඒකක බද්දක් පැනවීම හඳුන්වයි.

# බදු පැනවීම

බදු පැනවිය හැකි පාර්ශව 02 කි.

- සැපයුම්කරුවන් මත බදු පැනවීම.
- ගැනුම්කරුවන් මත බදු පැනවීම.



❖ භාණ්ඩ මත පනවනු ලබන බදු අනුපාතිකවල ස්වරූප දෙකකි.

- ප්‍රතිශතක බද්ද
- ඒකක බද්ද

- **ප්‍රතිශතක බද්ද**

නිෂ්පාදනය හෝ පරිභෝජනය කරන භාණ්ඩයේ වටිනාකම මත කිසියම් ප්‍රතිශතයක් බදු වශයෙන් අය කර ගැනීම ප්‍රතිශත බද්දක් වශයෙන් හඳුන්වයි.

**නිදසුන් :**

සීනි කිලෝග්‍රෑම් 1 වටිනාකම මත 2% ක බද්දක් පැනවීම

ආනයනික තීරු බදු, / VAT

- **ඒකක බද්ද**

නිෂ්පාදනය හෝ පරිභෝජනය කරනු ලබන භාණ්ඩ ඒකකයක් මත කිසියම් රුපියල් ප්‍රමාණයක් බදු වශයෙන් අයකර ගැනීම ඒකක බද්දක් පැනවීම යන්නෙන් අදහස් වේ. මෙය නිශ්චිත බද්දකි.

**නිදසුන් :**

සීනි කිලෝග්‍රෑම් 1 සඳහා රුපියල් 10/= ක් බදු අය කිරීම

පාන් රාත්තලකට රුපියල් 2/= ක බද්දක් අය කිරීම

රෙදි මීටරයකට රුපියල් 3/= ක් බදු අය කිරීම

## 01. සැපයුම්කරු මත ඒකක බදු පැනවීම

මේ නිසා සිදු වන්නේ නිෂ්පාදන පිරිවැය ඉහළ යෑමයි.

මේ නිසා සැපයුමෙහි අඩුවීමක් සිදුවන අතර, බද්දේ ප්‍රමාණයෙන් සැපයුම් වක්‍රය වමට විතැන් වීමක් සිදුවේ.

මෙලෙසින් ඒකක බද්දක් පැනවීම නිසා වෙළඳපොළ සමතුලිතයට වන බලපෑම ලේඛන, ප්‍රස්තාර හා සමීකරණ මගින් පෙන්නුම් කළ හැකිය.

සැපයුම්කරු මත ඒකක බද්දක් පැන වූ විට එම බද්ද,

- සැපයුම් ලේඛනයට
- සැපයුම් වක්‍රයට
- සැපයුම් සමීකරණයට

පහත ලෙස ගැළපිය හැකිය.

පහත දැක්වෙන්නේ තරගකාරි භාණ්ඩ වෙළඳපොළක කිසියම් භාණ්ඩයක් සඳහා වන ඉල්ලුම් හා සැපයුම් ලේඛනයකි.

| මිල රු: | සැපයුම් ප්‍රමාණය (ඒකක) |
| --- | --- |
| 0 | 0 |
| 5 | 10 |
| 10 | 20 |
| 15 | 30 |
| 20 | 40 |
| 25 | 50 |
| 30 | 60 |
| 35 | 70 |
| 40 | 80 |

## I. ඒකක බද්දක් නිසා සැපයුම් ලේඛනය වෙනස් වීම.


- ආණ්ඩුව මෙම භාණ්ඩයේ සෑම විකුණුම් ඒකකයකින්ම රුපියල් 5.00 ක බද්දක් අය කරන බව සිතමු. මේ නිසා වෙළඳපොළ නව සැපයුම් ලේඛනය පහත පරිදි වේ.

| මිල (රු) | ඒකක බද්ද (රු) | බද්දෙන් පසු මිල (රු) | සැපයුම් ප්‍රමාණය (ඒකක) |
|---|---|---|---|
| 0 | 5 | 5 | 0 |
| 5 | 5 | 10 | 10 |
| 10 | 5 | 15 | 20 |
| 15 | 5 | 20 | 30 |
| 20 | 5 | 25 | 40 |
| 25 | 5 | 30 | 50 |
| 30 | 5 | 35 | 60 |
| 35 | 5 | 40 | 70 |
| 40 | 5 | 45 | 80 |

❖ ඒකක බද්ද නිෂ්පාදකයාට පිරිවැයක් වන බැවින් බද්ද පැනවීම නිසා සැපයුම් ප්‍රමාණය අඩු වී ඇති බව ඉහත වගු සටහනෙන් පැහැදිලි වේ.

## II. ඒකක බද්ද නිසා සැපයුම් වක්‍රය වෙනස් වීම.

උදා - ඉහත නිදසුනට අනුව,



නිෂ්පාදකයන් මත රුපියල් 5 ක ඒකක බද්දක් පැනවීම නිසා සැපයුම් වක්‍රය $s - s_1$ දක්වා වමට විතැන් වී ඇති අතර සමතුලිතය ද වෙනස් වී ඇත.

**එනම්, බද්දට පෙර**

සමතුලිත මිල = රු:20.00

සමතුලිත ප්‍රමාණය = ඒකක 40


**බද්දට පසු,**

සමතුලිත මිල = රු:22.50

සමතුලිත ප්‍රමාණය = ඒකක 35

❖ නිෂ්පාදකයන් මත ඒකක බදු පැනවිම නිසා සමතුලිතය වෙනස් වීමට අමතරව සුභසාධන ප්‍රතිපාකයන්ද හටගනී.

❖ පහත ප්‍රස්තාර සටහන මගින් එම සුභසාධන ප්‍රතිවිපාකයන් හදුනා ගත හැකිය



## බද්දට පෙර

පාරිභෝගික අතිරික්තය = A + B + C + D

පාරිභෝගික අතිරික්තය = (උපරිම මිල - ඉල්ලුම් මිල) x සමතුලිත ප්‍රමාණය / 2

= (40 -20) x 40 / 2

= රු:400 /=

නිෂ්පාදන අතිරික්තය = H + G + F + I + J

නිෂ්පාදන අතිරික්තය = සමතුලිත මිල - අවම සැපයුම් මිල) x සමතුලිත ප්‍රමාණය / 2

= (20 -0) ∘ 40 / 2

= රු:400 /=

ආර්ථික අතිරික්තය = (A + B + C + D& + ^H + G + F + I + J )

= රු:400 + රු:400

= රු: 800 /=

## 02) බද්දට පසු

පාරිභෝගික අතිරික්තය= A

$$= \frac{(\text{උපරිම ඉල්ලුම් මිල} - \text{නව සමතුලිත මිල}) \times \text{නව සමතුලිත ප්‍රමාණය}}{2}$$

$$= \frac{(40 - 22.50) \times 35}{2}$$

= රු: 306.25 /=

නිෂ්පාදන අතිරික්තය= I + J

$$= \frac{(\text{නිෂ්පාදකයාට ලැබෙන මිල} - \text{අවම සැපයුම් මිල}) \times \text{නව සමතුලිත ප්‍රමාණය}}{2}$$

$$= \frac{(17.50 - 0) \times 35}{2}$$

= රු: 306.25 /=

ආර්ථික අතිරික්තය = (A) + ( I + J )

= රු:306.25 + රු:306.25

= රු: 612.50 /=

03) බද්ද නිසා පාරිභෝගික අතිරික්තයේ වූ අහිමි වීම = (A + B + C + D) - A

= B + C+ D

=රු:400 + රු:306.25

=රු: 93.75

බද්ද නිසා නිෂ්පාදන අතිරික්තයේ වූ අහිමි වීම= (H + G + F + I + J ) - ( I + J )

= (H + G + F )

= රු:400 + රු:306.25

= රු: 93.75

I. ක්‍රමය

බද්ද නිසා ආර්ථික අතිරික්තයේ
වූ අහිමි වීම = B + C + D + H + G + F
= රු:93.75 + රු:93.75
= රු:187.50

II ක්‍රමය

බද්ද නිසා අහිමි වූ
ආර්ථික අතිරික්තය = බද්දට පෙර ආර්ථික අතිරික්තය - බද්දට පසු ආර්ථික අතිරික්තය

= රු: 800 - රු:612.50
= රු:187.50

04) ඒකක බද්දෙන් රජයට ලැබෙන ආදායම

= B+ C+ H + G

=ඒකක බද්දේ ප්‍රමාණය x නව සමතුලිත ප්‍රමාණය

= රු: 5 × 35

= රු: 175/=

05)ඒකක බද්දෙන් පාරිභෝගිකයා දරන ප්‍රමාණය

=බද්දට පසු සමතුලිත මිල x බද්දට පෙර සමතුලිත මිල

= රු:22.50 - රු:20.00

= රු: 2.50

පාරිභෝගිකයා දරන බදු බර = B+ C

= 2.50 × 35

= රු: 87.50

## 06)ඒකක බද්දෙන් නිෂ්පාදකයා දරන ප්‍රමාණය

= සමතුලිත මිල - නිෂ්පාදකයාට ලැබෙන මිල

= රු:20.00 - රු:17.50

= <u>රු: 2.50</u>

නිෂ්පාදකයාගේ බදු බර = H+ G

= 2.50 × 35

= <u>රු: 87.50</u>

**07) පාරිභෝගිකයා හා නිෂ්පාදකයා යන දෙදෙනාගේ ම බදු බර**

= B+ C + H + G

= රු:87.50 - රු:87.50

= <u>රු:175/=</u>

(ඒකක බද්දෙන් රජයට ලැබෙන ආදායම නිෂ්පාදකයා සහ පාරිභෝගිකයා දෙදෙනාගේම බදු බරෙහි එකතුවට සමාන වේ.)

## I) ක්‍රමය

)ඒකක බද්ද නිසා සමස්ත

සමාජයට අහිමි වීම = රජයේ ආදායම - ආර්ථික අතිරික්තයේ අහිමිවීම

= රු:175 - රු:87.50

= <u>රු:12.50</u>

ඒකක බද්ද නිසා සමස්ත සමාජයට රු:12.50 ක අහිමි වීමක් සිදුව ඇත.

## II ක්‍රමය

සුභසාධනයේ අහිමිවිම D + F ක්ෂේත්‍රඵලයට සමාන වේ නම්. එනම්,

රජයේ ආදායම - ආර්ථික අතිරික්තයේ වූ අහිමි වීම

(B+ C + H + G) -( B+ C + D) + (H + G + F)

(B+ C + H + G) - B - C - D - H - G - F = - (D - F)

$$= \frac{\text{ඒකක බද්ද x සමතුලිත ප්‍රමාණයේ වෙනස}}{2}$$

$$= \frac{5 \times 5}{2}$$

= රු:12.50

## III. ඒකක බද්දක් නිසා සැපයුම් සමීකරණය වෙනස් වීම.

- ඒකක බදු පැනවීම ආශ්‍රිත ආර්ථික ප්‍රතිවිපාක සමීකරණ භාවිතයෙන්ද සොයා බැලිය හැකිය.

- ඉහත සැලකිල්ලට ගත් නිදසුනට අනුව ඒකක බදු පැනවීමට පෙර ඉල්ලීම් හා සැපයුම් සමීකරණ පහත පරිදි වේ.

$$Qd = 80 - 2P$$

$$QS = 0 + 2P$$

♣ මේ නිසා බද්දට පෙර සමතුලිතය,

| | |
|---|---|
| Qd | = Qs |
| 80 - 2P | = 0 + 2P |
| 80 | = 4p |
| 20 | = p |

සමතුලිත මිල = රුපියල් 20/=

සමතුලිත ප්‍රමාණය = ඒකක 40

P = 20 ඉල්ලුම් සමීකරණයට ආදේශය

| | |
|---|---|
| Qd | = 80 - 2P |
| | = 80 - 2 x 20 |
| | = 40 |

- නිෂ්පාදකයන්ගෙන් ඒකක බදු පැනවීම නිෂ්පාදකයාට පිරිවැයක් වේ. ඒ බව සැපයුම් සමීකරණ මගින් පහත ලෙස දැක්විය හැකිය

$$Qs = 0 + 2(P - t)$$

$$Qs = 2(P - 5)$$

$$Qs = 2p - 10$$

$$Qs = -10 + 2P$$

♣ නව සැපයුම් සමීකරණය $Qs = -10 + 2P$

බද්දට පසු නව සමතුලිතය,

$$Qd = Qs$$

$$80 - 2P = -10 + 2P$$

$$90 = 4P$$

$$22.50 = P$$

P = 22.50 සැපයුම් සමීකරණයට ආදේශයෙන් නව සමතුලිත ප්‍රමාණය,

$$Qs = 10 + 2(22.50)$$

$$\underline{Qs = 35}$$

බද්දට පසු සමතුලිත මිල = රු:22.50

බද්දට පසු සමතුලිත ප්‍රමාණය = ඒකක 35

## 02. ගැනුම්කරුවන් මත ඒකක බදු පැනවීම

මෙයින් අදහස් වන්නේ භාණ්ඩයක් මිලදී ගන්නා අවස්ථාවේදී ඒකකයක් මත නිශ්චිත රුපියල් ප්‍රමාණයක් ගැනුම්කරුගෙන් බදු ලෙස අය කිරීමයි.

**නිදසුන් : විකුණුම් බදු, පාරිභෝගික වැට් බදු**


- මෙහිදී භාණ්ඩයක් මිලදී ගන්නා අවස්ථාවේ දී අය කරන හෙයින් නෛතික වශයෙන් බද්ද මුළුමනින්ම ගෙවනු ලබන්නේ ගැනුම්කරුය.

නිදසුන් : දොඩම් ගෙඩියක් මත රු: 10 ක අලෙවි බද්දක් අය කරනු ලබයි නම් දොඩම් මිලදී ගන්නා සෑම අවස්ථාවකදී ම දොඩම් ගෙඩියකට රු:10 බැගින් බද්දක් ආණ්ඩුවට ගෙවිය යුතු ය.

- ගැනුම්කරුවන් මත ඒකක බද්දක් පැන වූ විට එම භාණ්ඩයේ සැපයුම් වක්‍රයට කිසිදු බලපෑමක් ඇති නොවේ.

- එහෙත් ගැනුම්කරුවන් මත ඒකක බදු පැනවූ විට ගැනුම්කරුවන් ගෙවිය යුතු මිල ඉහළ යන බැවින් ගැනුම්කරුවන් මිලදී ගත් ඒකක සඳහා බද්දෙන් පසු ගෙවීමට කැමති මිල අඩුවේ. මේ නිසා පැවති මිල ගණන් යටතේම බද්දේ ප්‍රමාණයෙන් ඉල්ලුම් වක්‍රය වමට විතැන් වේ.

ගැනුම්කරු මත ඒකක බද්දක් පැන වූ පසු සමතුලිතය වෙනස් වන ආකාරය පහත රූප සටහනේ දැක්වේ.




- ඉහත රූප සටහනට අනුව ගැනුම්කරු මත ඒකක බද්ද පැනවීමට පෙර සමතුලිතය $E_0$ ලක්ෂයෙන් දැක්වේ. එහිදී සමතුලිත මිල $P_0$ ද සමතුලිත ප්‍රමාණය $Q_0$ ද වේ. ගැනුම්කරු මත ඒකක බද්ද පැනවීමෙන් පසු නව සමතුලිතය $E_1$ ලක්ෂයයෙන් දැක්වේ. එහිදී සමතුලිත මිල $P_1$ ද සමතුලිත ප්‍රමාණය $Q_1$ ද වේ.

# Question

01. තරගකාරී වෙළඳපොළට අදාළ ඉල්ලුම් සැපයුම් ශ්‍රිත පහත දැක්වේ.

$$Qd = 1000 - 4p$$

$$Qs = -300 + 4p$$

1 . ඉහත දක්වන ලද තොරතුරු ආශ්‍රයෙන් සමතුලිත මිල හා ප්‍රමාණය ප්‍රස්තාරයකින් දක්වන්න.

2 . පාරිභෝගික අතිරික්තයේ අගය කොපමණද?

3 . නිෂ්පාදන අතිරික්තයේ අගය කොපමණද?

4 . ආර්ථික අතිරික්තයේ අගය කොපමණද?

❖ මෙම භාණ්ඩයේ අලෙවි වන සෑම ඒකකයක් මතම රු. 30ක අලෙවි බද්දක් පැනවූයේ නම් පහත අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

1 . නව වෙළදපොළ සැපයුම් වක්‍රය ඉහත ප්‍රස්තාර සටහනේ දක්වා, බදු පසු සමතුලිත මිල හා ප්‍රමාණය සොයන්න.

2 . රජයේ බදු ආදායම කොපමණද?

3 . බද්දෙන් පසු පාරිභෝගික අතිරික්තය සොයන්න.

4 . බද්දෙන් පසු නිෂ්පාදන අතිරික්තය සොයන්න.

5 . බද්දෙන් පසු ආර්ථික අතිරික්තය ගණනය කරන්න.

6 . බදු බරින් පාරිභෝගිකයා දරණ කොටස සොයන්න.

7 . බද්ද නිසා ආර්ථිකයට අහිමි වන ශුභ සාධනය (අධිබදු බර) කොපමණද?

# 3.3. සැපයුම්කරු මත ඒකක බද්දක් පැනවීමෙන් පසු බදු බර බෙදී යන ආකාරය විග්‍රහ කරයි.


- **බදු බර යන්න හඳුන්වයි**

❖ ඉල්ලුම් හා සැපයුම් නම්‍යතාවයේ ස්වරූපය මත ඒකක බද්දක් පැනවීමෙන් බදු බර පාරිභෝගිකයා හා නිෂ්පාදකයා අතර බෙදන ආකාරය විස්තර කරයි.

❖ නිෂ්පාදකයන් මත ඒකක බද්දක් පැන වූ විට එහි අවසාන බදු දැරීම කෙරෙහි බලපාන ප්‍රධානම සාධකය වන්නේ ඉල්ලුම් හා සැපයුම් නම්‍යතාවයයි

♣ විවිධ ඉල්ලුම් අවස්ථාවන්හි දී බදු බරෙහි දැරීම සිදුවන ආකාරය පහත ලෙස රූප සටහන් මගින් දැක්විය හැකිය.

## 01) පූර්ණ අනම්‍ය ඉල්ලුම් අවස්ථාව




- රූප සටහනට අනුව බද්දට පෙර සැපයුම් වක්‍රය S වලින් දැක්වෙන අතර බද්දට පසු සැපයුම් වක්‍රය $S_1$ වේ.

- බද්දට පෙර සමතුලිතය a ලක්ෂ්‍යයෙන්ද, බද්දට පසු සමතුලිතය b ලක්ෂ්‍යයෙන්ද, දැක්වේ.
- $a - b$ දුරෙන් ඒකක බද්දේ ප්‍රමාණය දැක්වෙන අතර සමතුලිත මිලෙහි ඉහළ යාම $a - b$ දුරට සමාන වේ.
- එනම් $a - b = P_1 - P_2$

- ඒකක බද්දේ ප්‍රමාණයෙන්ම සමතුලිත ඉහළ යාමෙන් පෙන්නුම් කරන්නේ පූර්ණ අනම්‍ය ඉල්ලුම් අවස්ථාවකදී මුළු බදු බරම පාරිභෝගිකයාට දැරීමට සිදුවන බවයි.

- ඒ අනුව රූප සටහනේ අඳුරු කළ A ක්ෂේත්‍රඵලයෙන් පාරිභෝගිකයා දරන එම මුළු බදු බර දැක්වේ.

## 02) පූර්ණ නම්‍ය ඉල්ලුම් අවස්ථාව





- ඒකක බද්ද නිසා සැපයුම් වක්‍රය $S - S_1$ දක්වා වමට විතැන් වී ඇත.
- බද්දට පෙර සමතුලිතය $C$ ලක්ෂ්‍යයෙන්ද, බද්දට පසු සමතුලිතය $a$ ලක්ෂ්‍යයෙන්ද, දැක්වේ.
- බද්ද පැනවීම නිසා සමතුලිත ප්‍රමාණය $Q - Q_1$ දක්වා අඩු වී ඇති අතර සමතුලිත මිලෙහි කිසිදු වෙනසක් සිදු වි නැත.
- එනම් බද්දට පෙරත්, පසුත් සමතුලිත මිල $P_2$ මය.

- එයින් අදහස් වන්නේ ඒකක බද්ද නිසා පාරිභෝගිකයා ගෙවන මිලෙහි කිසිදු වෙනසක් සිදු වි නොමැති බවයි.
- මේ නිසා a – b දුරෙන් දැක්වෙන ඒකක බද්දේ ප්‍රමාණයෙන්ම නිෂ්පාදකයාට ලැබෙන මිල $P_2 - P_1$ දක්වා අඩු වී ඇත.

- **ඒ අනුව රූප සටහනේ අඳුරු කළ *B* ක්ෂේත්‍රඵලයෙන් දැක්වෙන මුළු බදු බරම නිෂ්පාදකයා විසින් දරනු ලැබේ.**

# 03) ඒකීය නම්‍ය ඉල්ලුම් අවස්ථාව





- රූප සටහනේ $C$ ලක්ෂ්‍යයෙන් බද්දට පෙර සමතුලිතයත් බද්දට පසු සමතුලිතය $a$ ලක්ෂ්‍යයෙන්ද, දැක්වේ.

- **a – b දුරෙන් බද්දේ ප්‍රමාණය දැක්වෙන අතර, මෙහිදී බදු බර පාරිභෝගිකයා හා නිෂ්පාදකයා අතර සමානව බෙදී ගොස් ඇත.**

- ඒ අනුව $P - P_2$ දුරෙන් ඒකක බද්දෙන් පාරිභෝගිකයා දරන ප්‍රමාණයත්, $P - P_1$ දුරෙන් නිෂ්පාදකයා දරන ප්‍රමාණයත්, දැක්වේ.


- ඒ අනුව රූප සටහනේ අඳුරු කළ $A$ ක්ෂේත්‍රවලයෙන් පාරිභෝගිකයාගේ මුළු බදු බරත්, $B$ ක්ෂේත්‍රවලයෙන් නිෂ්පාදකයාගේ මුළු බදු බරත් දැක්වේ.

# 04) අනම්‍ය ඉල්ලුම් අවස්ථාව




- රූප සටහනට අනුව බද්දට පෙර සමතුලිතය *C* ලක්ෂ්‍යයෙන් බද්දට පසු සමතුලිතය *a* ලක්ෂ්‍යයෙන්ද, දැක්වේ.
- a – b දුරෙන් බද්දේ ප්‍රමාණය දැක්වෙන අතර, එයින් පාරිභෝගිකයා දරන ප්‍රමාණය $P - P_2$ වන අතර, $P - P_1$ දුරෙන් නිෂ්පාදකයා දරන ප්‍රමාණයත්, දැක්වේ.
- **ඒ අනුව අනම්‍ය ඉල්ලුම් අවස්ථාවක දි *A* ක්ෂේත්‍රඵලයෙන් දැක්වෙන පරිදි වැඩි බදු බරක් පාරිභෝගිකයාටත්, *B* ක්ෂේත්‍රඵලයෙන් දැක්වෙන පරිදි අඩු බදු බරත් නිෂ්පාදකයාත් දරති.**

# 05) නම්‍ය ඉල්ලුම් අවස්ථාව





- රූප සටහනට අනුව බද්දට පෙර සමතුලිතය *C* ලක්ෂ්‍යයෙන් බද්දට පසු සමතුලිතය *a* ලක්ෂ්‍යයෙන්ද, දැක්වේ.

- $a - b$ දුරෙන් බද්දේ ප්‍රමාණය දැක්වෙන අතර, එයින් $P - P_2$ දුරෙන් පාරිභෝගිකයා දරන ප්‍රමාණයත්, $P - P_1$ දුරෙන් නිෂ්පාදකයා දරන ප්‍රමාණයත්, දැක්වේ.

- **ඒ අනුව රූප සටහනේ *A* ක්ෂේත්‍රඵලයෙන් දැක්වෙන අඩු බදු බර පාරිභෝගිකයාත්, *B* ක්ෂේත්‍රඵලයෙන් දැක්වෙන වැඩි බදු බර නිෂ්පාදකයාත් දරති.**


- විවිධ සැපයුම් නම්‍යතා අවස්ථාවන්හි දි බදු බරෙහි දැරීම සිදුවන ආකාරය පහත ලෙස රූප සටහනක් මගින් දැක්විය හැකිය.

# 06) පූර්ණ අනම්‍ය සැපයුම් අවස්ථාව





- පූර්ණ අනම්‍ය සැපයුම් අවස්ථාවකදී ඒකක බද්දක් පැන වූ විට සැපයුම් වක්‍රයේ කිසිදු වෙනසක් සිදුනොවේ.
- මේ නිසා බද්දට පෙරත්, පසුත් සමතුලිතයෙහි කිසිදු වෙනසක් සිදු නොවන අතර a ලක්ෂ්‍යයෙන් දැක්වෙන්නේ එම බද්දට පෙර සහ පසු සමතුලිතයයි.
- මෙහිදී ඒකක බද්ද පැනවීම නිසා පාරිභෝගිකයාට ගෙවන මිලෙහි කිසිදු වෙනසක් සිදුව නැත. එය බද්දට පෙරත් පසුත් $P$ වේ.
- ඒ නිසා $a - b$ දුරෙන් දැක්වෙන ප්‍රමාණයෙන්ම නිෂ්පාදකයාට ලැබෙන මිල $P - P_1$ දක්වා අඩු වී ඇත.
- **ඒ අනුව $B$ ක්ෂේත්‍රඵලයෙන් දැක්වෙන මුළු බදු බරම නිෂ්පාදකයා විසින් දරනු ලැබේ.**

# 07) පූර්ණ නම්‍ය සැපයුම් අවස්ථාව





- රූප සටහනට අනුව බද්දට පෙර සමතුලිතය $a$ ලක්ෂ්‍යයෙන්ද, බද්දට පසු සමතුලිතය $b$ ලක්ෂ්‍යයෙන්ද, දැක්වේ.
- b-c දුරෙන් බද්දේ ප්‍රමාණය දැක්වෙන අතර එම බද්දේ ප්‍රමාණයෙන්ම සමතුලිත මිල එනම් පාරිභෝගිකයා ගෙවන මිල ඉහළ ගොස් ඇත.
- එයින් පෙන්නුම් කරන්නේ පූර්ණ නම්‍ය සැපයුම් අවස්ථාවකදි A ක්ෂේත්‍රඵලයෙන් දැක්වෙන මුළු බදු බරම පාරිභෝගිකයා විසින් දරනු ලැබේ.

# 08) ඒකීය නම්‍ය සැපයුම් අවස්ථාව





- රූප සටහනට අනුව බද්දට පෙර සමතුලිතය *a* ලක්ෂයයෙන්ද, බද්දට පසු සමතුලිතය *b* ලක්ෂයයෙන්ද, දැක්වේ.
- b – c දුරෙන් බද්දේ ප්‍රමාණය දැක්වෙන අතර මෙහිදී බදු බර පාරිභෝගිකයා හා නිෂ්පාදකයා අතර සමානව බෙද දී ගොස් ඇත.
- ඒ අනුව *A* ක්ෂේත්‍රඵලයෙන් පාරිභෝගිකයාත්, *B* ක්ෂේත්‍රඵලයෙන් නිෂ්පාදකයාත් දරන බදු බර එක සමාන වේ.

# 09) අනම්‍ය සැපයුම් අවස්ථාව




- රූප සටහනට අනුව බද්දට පෙර සමතුලිතය *a* ලක්ෂයයෙන්ද, බද්දට පසු සමතුලිතය *b* ලක්ෂයයෙන්ද, දැක්වේ.
- b-c දුරෙන් ඒකක බද්දේ ප්‍රමාණය දැක්වෙන අතර එයින් P-P2 ප්‍රමාණය පාරිභෝගිකයාත්, P-P1 ප්‍රමාණය නිෂ්පාදකයාත් දරයි.
- **ඒ අනුව *A* ක්ෂේත්‍රඵලයෙන් දැක්වෙන පරිදි අඩු බදු බරක් පාරිභෝගිකයාටත්, *B* ක්ෂේත්‍රඵලයෙන් දැක්වෙන පරිදි වැඩි බදු බරත් නිෂ්පාදකයා විසින්ද දරනු ලැබේ.**

# 10) නම්‍ය සැපයුම් අවස්ථාව




- මෙහිදී බද්දට පෙර සමතුලිතය *a* ලක්ෂයයෙන්ද, බද්දට පසු සමතුලිතය *b* ලක්ෂයයෙන්ද, දැක්වේ.
- b-c දුරෙන් ඒකක බද්දේ ප්‍රමාණය දැක්වෙන අතර එයින් P-P2 ප්‍රමාණය පාරිභෝගිකයාත්, P-P1 ප්‍රමාණය නිෂ්පාදකයාත් දරයි.
- ඒ අනුව නම්‍ය සැපයුම් තත්ත්වයකදී *A* ක්ෂේත්‍රඵලයෙන් දැක්වෙන පරිදි වැඩි බදු බරක් පාරිභෝගිකයාටත්, *B* ක්ෂේත්‍රඵලයෙන් දැක්වෙන පරිදි අඩු බදු බරත් නිෂ්පාදකයාත් දරති.



## 3.4 සැපයුම්කරුවන්ට ඒකක සහනාධාරයක් ලබාදීම ඇසුරෙන් වෙළඳපොළට රජයේ මැදිහත් වීම විග්‍රහ කරයි.

- සැපයුම්කරු වෙත ලබාදෙන ඒකක සහනාධාරය අර්ථ දක්වයි.
- සැපයුම්කරු වෙත ඒකක සහනාධාරය ලබාදුන් විට වෙළඳපොළ සමතුලිතය කෙරෙහි ඇතිවන බලපෑම ඉල්ලුම් හා සැපයුම් ලේඛන ඇසුරින් විග්‍රහ කරයි.
- සැපයුම්කරු වෙත ඒකක සහනාධාරය ලබාදුන් විට වෙළඳපොළ සමතුලිතයට ඇතිවන බලපෑම් ඉල්ලුම් සැපයුම් වක්‍ර ඇසුරින් විග්‍රහ කරයි.
- ඒකක සහනාධාරයක සුභසාධන ප්‍රතිවිපාකය ප්‍රස්තාර සටහන් ඇසුරින් විග්‍රහ කරයි.

# සහනාධාර ලබාදිම

නිෂ්පාදන සහනාධාර ස්වරූප දෙකකි.

- ඒකක සහනාධාරය
- වටිනාකම මත

♣ නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ ඒකකයක් සඳහා නිශ්චිත රුපියල් ප්‍රමාණයක් සහනාධාර වශයෙන් ලබාදිම සැපයුම්කරු මත ඒකක සහනාධාරයක් ලබාදිම යන්නෙන් අදහස් වේ.

**නිදසුන් : තේ කිලෝවකට රු:20/= ක සහනාධාරයක් ලබාදිම**

- සැපයුම්කරු මත ඒකක සහනාධාර ලබාදීමේදී අනිවාර්ය ප්‍රතිඵලය වන්නේ නිෂ්පාදන පිරිවැය පහළ යාමයි.
- මේ නිසා සැපයුමෙහි වැඩිවීමක් සිදුවන අතර සහනාධාරයේ ප්‍රමාණයෙන් සැපයුම් වක්‍රය දකුණට විතැන් වේ.
- ඒකක සහනාධාරයක් නිසා වෙළඳපොළ සමතුලිතයට සිදුවන බලපෑම ලේඛන, ප්‍රස්තාර හා සමීකරණ මගින් පෙන්නුම් කළ හැකිය.

# I. ඒකක සහනාධාරයක් නිසා සැපයුම් ලේඛනයේ වෙනස් වීම.

- පහත දැක්වෙන්නේ තරගකාරී භාණ්ඩ වෙළඳපොළක කිසියම් භාණ්ඩයක් සඳහා වන ඉල්ලුම් සැපයුම් ලේඛනය.

| මිල | ඉල්ලුම් ප්‍රමාණය | සැපයුම් ප්‍රමාණය |
|---|---|---|
| 0 | 80 | 0 |
| 5 | 70 | 10 |
| 10 | 60 | 20 |
| 15 | 50 | 30 |
| 20 | 40 | 40 |
| 25 | 30 | 50 |
| 30 | 20 | 60 |
| 35 | 10 | 70 |
| 40 | 0 | 80 |

ආණ්ඩුව මෙම භාණ්ඩයේ සෑම නිෂ්පාදන ඒකකයක් සඳහා රුපියල් 5.00 ක සහනාධාරයක් ලබා දෙන්නේ යයි සිතමු. මේ නිසා වෙළඳපොළ නව සැපයුම් ලේඛනය පහත පරිදි වේ.


$$Qd = 80 - 2P$$

$$Qs = 0+2P$$

| මිල (රු) | ඒකක බද්ද (රු) | බද්දෙන් පසු මිල (රු) | සැපයුම් ප්‍රමාණය (ඒකක) |
|---|---|---|---|
| 0 | 5 | -5 | 0 |
| 5 | 5 | 0 | 10 |
| 10 | 5 | 5 | 20 |
| 15 | 5 | 10 | 30 |
| 20 | 5 | 15 | 40 |
| 25 | 5 | 20 | 50 |
| 30 | 5 | 25 | 60 |
| 35 | 5 | 30 | 70 |
| 40 | 5 | 35 | 80 |

- ඒකක සහනාධාරය නිසා නිෂ්පාදකයාගේ පිරිවැය අඩුවන බැවින් සහනාධාර ලබාදිම නිසා සැපයුම් ප්‍රමාණය වැඩි වී ඇති බව ඉහත වගු සටහනෙන් පැහැදිලිය.

## II. ඒකක සහනාධාරයක් නිසා සැපයුම් වක්‍රය වෙනස් වීම.




- ඒකක සහනාධාරයක් ලබාදීම ආශ්‍රිතව ඉහත ලේඛනවලින් හෙළිවන තොරතුරු පහත ආකාරයට ප්‍රස්තාර සටහන් මගින්ද පෙන්නුම් කළ හැකිය.
- නිෂ්පාදකයන්ට ඒකක සහනාධාර ලබා දීම නිසා සැපයුම් වක්‍රය සහනාධාරයේ ප්‍රමාණයෙන් $s - s_1$ දක්වා විතැන් වී ඇති අතර පෙර තිබූ සමතුලිතයද වෙනස් වී ඇත.

**සහනාධාරයට පෙර,**

සමතුලිත මිල = රු:20.00

සමතුලිත ප්‍රමාණය = ඒකක 40


**සහනාධාරයට පසු,**

සමතුලිත මිල = රු:17.50

සමතුලිත ප්‍රමාණය = ඒකක 45

- නිෂ්පාදකයන්ට ඒකක සහනාධාරයක් ලබා දීම නිසා ඉහත රූප සටහනේ දැක්වෙන පරිදි සමතුලිතය වෙනස්වීමට අමතරව තවත් සුභසාධන ප්‍රතිවිපාක හටගනී.

♣ ප්‍රස්තාර සටහනක් මගින් පහත ලෙස එම සුභසාධන ප්‍රතිවිපාක ද හඳුනා ගත හැකිය.



## 01) සහනාධාරයට පෙර

පාරිභෝගික අතිරික්තය = A + B

පාරිභෝගික අතිරික්තය = (උපරිම ඉල්ලුම් මිල - සමතුලිත මිල) x සමතුලිත ප්‍රමාණය / 2

= (40 -20) x 40 / 2

= රු:400 /=

නිෂ්පාදන අතිරික්තය= I + J

= සමතුලිත මිල - අවම සැපයුම් මිල) x සමතුලිත ප්‍රමාණය / 2

= (20 -0) x 40 / 2

= රු:400 /=

ආර්ථික අතිරික්තය = (A + B ) + ( I + J )

= රු:400 + රු:400

= රු:800 /=

## 02) සහනාධාරයට පසු

❖ පාරිභෝගික අතිරික්තය= A+B+I+H+G

$$= \frac{(\text{උපරිම ඉල්ලුම් මිල} - \text{නව සමතුලිත මිල}) \times \text{නව සමතුලිත ප්‍රමාණය}}{2}$$

$$= \frac{(40 - 17.50) \times 45}{2}$$

= රු:506.25 /=

❖ නිෂ්පාදන අතිරික්තය= B + C + I + J

$$= \frac{(\text{නිෂ්පාදකයාට ලැබෙන මිල} - \text{අවම සැපයුම් මිල}) \times \text{නව සමතුලිත ප්‍රමාණය}}{2}$$

$$= \frac{(22.50 - 0) \times 45}{2}$$

= රු: 506.25 /=

❖ ආර්ථික අතිරික්තය = (A+B+I+H+G) + ( B+ C + I + J )

= රු:506.25 + රු: 506.25

= රු: 1012.50 /=

03) සහනාධාරය නිසා පාරිභෝගික අතිරික්තයේ වූ වැඩිවීම

$$= (A + B + I + H + G) - (A + B)$$

$$= I + H + G$$

= රු: 506.25 - රු: 400

= රු: 106.25

04) සහනාධාරය නිසා නිෂ්පාදන අතිරික්තයේ වූ වැඩිවීම

$$= (B + C + I + J) - (I + J)$$

$$= B + C$$

= රු: 506.25 - රු: 400

= රු: 106.25

## 05) සහනාධාරය නිසා ආර්ථික අතිරික්තයේ වූ වැඩිවීම

### I ක්‍රමය

= ( I + J + G ) + ( B + C )

= රු: 106.25 ¸ රු: 106.25

= <u>රු: 212.50</u>

### II ක්‍රමය

සහනාධාරය නිසා ආර්ථික අතිරික්තයේ වූ වැඩිවීම = සහනාධාරයට පසු ආර්ථික අතිරික්තය - සහනාධාරයට පෙර ආර්ථික අතිරික්තය

= රු: 1012.50 - රු:800

= <u>රු: 212.50</u>

06) සභනාධාරය වෙනුවෙන් රජයට දැරීමට සිදුවන පිරිවැය

= B + C + I + H + G + F

= 5 × 45

= රු: 225



07)

## I ක්‍රමය

සහනාධාරය නිසා සමාජ= පාරිභෝගික අතිරික්තයේ -නිෂ්පාදන අතිරික්තයේ - පිරිවැය
සුභසාධනයට වන බලපෑම වැඩිවිම වැඩිවීම

= ( I + J + G ) + ( B + C ) - ( B + C+I+H+G+F )

= රු: 106.25 + රු: 106.25 - 225

= රු: 12.50

## II ක්‍රමය

F ක්ෂේත්‍රඵලය

$$= \frac{\text{සමතුලිත ප්‍රමාණයේ වෙනස x සහනාධාරයේ ප්‍රමාණය}}{2}$$

$$= \frac{5 \times 5}{2}$$

= රු:12.50

## III. ඒකක සහනාධාරයක් නිසා සැපයුම් සමීකරණය වෙනස් වීම.

- ඒකක සහනාධාර පැනවීමෙන් ලැබෙන ආර්ථික ප්‍රතිවිපාක සමිකරණ මගින්ද සොයා බැලිය හැකිය.
- ඉහත සැලකිල්ලට ගත් නිදසුනට අනුව, සහනාධාරයට පෙර ඉල්¨ම් හා සැපයුම් සමිකරණ

$$Qd = 80 - 2P$$
$$Qs = 0+2P$$

- **සහනාධාරයට පෙර සමතුලිතය**

$$80 - 2P = 0 + 2P$$
$$80 = 4P$$
$$20 = p$$

සමතුලිත මිල = රු:20.00

සමතුලිත ප්‍රමාණය,

$$Qd = 80 - 2P$$
$$= 80 - 2P$$

∴ <u>ඒකක 40</u>

ඒකක සහනාධාරය ලබාදීම නිසා නිෂ්පාදන පිරිවැයෙහි අඩුවක් සිදුවන බැවින් සහනාධාරයෙන් පසු සැපයුම් සමීකරණය,

$$Qs = 0 + 2(P + S)$$
$$Qs = 2\,(P + S)$$
$$Qs = 2P + 10$$
$$\underline{\underline{Qs = 10 + 2P}}$$


- **සහනාධාරයට පසු සමතුලිතය**

$$80 - 2P = 10 + 2P$$
$$70 = 4P$$
$$\underline{\underline{17.50 = P}}$$

සමතුලිත මිල = රු:17.50

සමතුලිත ප්‍රමාණය, = ඒකක 45

$$Qs = 10 + 2P$$
$$= 10 + 2 \times 17.50$$
$$= \underline{\underline{\text{ඒකක } 45}}$$



# 3.5 මිල පාලනය වෙළඳපොළ ක්‍රියාකාරිත්වයට ඇති කරන බලපෑම විමසයි

- මිල පාලනය අර්ථ දක්වයි.
- මිල පාලනයේ විවිධ ස්වරූප නම් කරයි.
- උපරිම මිල ප්‍රතිපත්තිය අර්ථ දක්වා ඉල්ලුම් සැපයුම් වක්‍ර ආශ්‍රිතව නිරූපණය කරයි.
- උපරිම මිල ප්‍රතිපත්තියෙහි ප්‍රතිවිපාක විග්‍රහ කරයි.
- උපරිම මිල ප්‍රතිපත්තිය අර්ථවත් කර ගැනීමට ගන්නා ක්‍රියාමාර්ග විස්තර කරයි.

- අවම මිල ප්‍රතිපත්තිය අර්ථ දක්වා ඉල්ලුම් සැපයුම් වක්‍ර ආශ්‍රිතව නිරූපණය කරයි.
- අවම මිල ප්‍රතිපත්තියේ ප්‍රතිවිපාක ඉදිරිපත් කරයි.
- අවම මිල ප්‍රතිපත්තිය අර්ථ දක්වයි.
- අවම මිලක් සහතික මිලක් බවට පත් කරගත හැකි ක්‍රියාමාර්ග පැහැදිලි කරයි.
- මිල ස්ථායිකරණ ක්‍රියාමාර්ග හඳුන්වයි.

## මිල පාලනය

- කිසියම් භාණ්ඩයක් හෝ සේවාවක් හෝ සඳහා වෙළඳපොළ ඉල්ලුම් හා සැපයුම් බලවේග මගින් තිරණය වී ඇති මිල ඇතැම් විට, පාරිභෝගිකයන්ට හා නිෂ්පාදකයන්ට අසාධාරණ විය හැකිය.

- මෙවැනි අවස්ථාවන්හි දි ආණ්ඩුව වෙළඳපොළ මිල පාලනය කරයි.

- ඒ අනුව මිල පාලනය යනු ආණ්ඩුව විසින් නිති රිති අණපනත් උපයෝගි කරගෙන කෘත්‍රිම මිලක් වෙළඳපොළෙහි ඇති කිරිමයි.

- මිල පාලනයේ ස්වරූප දෙකකි.

1 . උපරිම මිල නියම කිරීම

2 . අවම මිල නියම කිරිම

## 01. උපරිම මිල නියම කිරීම


- වෙළඳපොළ මිල යන්ත්‍රණය යටතේ තීරනය වන සමතුලිත මිල පාරිභෝගිකයාට අසාධාරණ වෙතැයි සිතූ විට ඔවුන්ට සාධාරනත්වය සැලසීම සඳහා ආණ්ඩුව විසින් නියම කරනු ලබන නීත්‍යානුකූල මිල උපරිම මිල සීමාව නමින් හැඳින්වේ.
- ආණ්ඩුව උපරිම මිල සිමා නියම කරනු ලබන්නේ පාරිභෝගිකයාට සාධාරණත්වය සඳහා වන බැවින් සමතුලිත මිලට වඩා පහළින් උපරිම මිල සිමා පැනවීම වැදගත්ය.
- **එවැනි සමතුලිත මිලට වඩා පහළින් නියම කරනු ලබන උපරිම මිල සීමාව සඵල උපරිම මිල නමින් හැඳින්වේ.**

**නිදසුන් :** **සහල්, පාන්, සීනි, පරිප්පු, මිල නියම කිරීම**

**කිරිපිටි මිල නියම කිරීම**

**උපරිම ගෙවල් කුලි නියම කිරීම**

- පහත රූප සටහනෙහි දැක්වෙන්නේ එවැනි සවිල උපරිම මිල සීමා නියම කිරීමකි




- ඉහත රූප සටහනෙහි දැක්වෙන පරිදි $P_1$ උපරිම මිල සීමාව නිසා ඉල්ලුම් ප්‍රමාණය $Q - Q_1$ දක්වා වැඩි වී ඇති අතර, සැපයුම් ප්‍රමාණය $Q - Q_2$ දක්වා අඩු වී ඇත.
- මෙහි ප්‍රතිඵලය වශයෙන් වෙළඳපොළෙහි $Q_2 - Q_1$ දක්වා වන අධි ඉල්ලුමක් හටගෙන ඇත.
- එසේම $Q_2$ ලෙසින් වන සැපයුම් ප්‍රමාණය $P_2$ ලෙසින් වන කළුකඩ මිලකට අලෙවි කිරීමටද නිෂ්පාදකයෝ පෙළඹෙති.

❖ **උපරිම මිල සීමා නියම කිරීම නිසා ඇතිවන ආර්ථික ප්‍රතිවිපාක**

1 . අධි ඉල්ලුම නිසා වෙළඳපොළෙහි භාණ්ඩ හිගයක් ඇතිවීම.


2 . නීති විරෝධී කළුකඩ මිල යටතේ භාණ්ඩ අලෙවි කිරීමට තැත් කිරීම.

3 . කළු කඩ මිල නිසා පෙර තිබූ සමතුලිත මිලටත්, වඩා ඉහළ මිලකට භාණ්ඩ අලෙවි කිරීම.

4 . උපරිම මිලත් සමගින් නිෂ්පාදකයන්ගේ ලාභ සීමා වන නිසා එම නිෂ්පාදන ක්ෂේත්‍රයේ කරනු ලබන ආයෝජන සීමා වීම.

5 . උපරිම මිල සීමාව නිසා පාරිභෝගික අතිරික්තයට සහ නිෂ්පාදන අතිරික්තයටද අයහපත් බලපෑමක් ඇති වී සමාජ සුභසාධනයටද හානි වීම.

උපරිම මිලක් පාරිභෝගික අතිරික්තයට, නිෂ්පාදන අතිරික්තයට බලපාන ආකාරය සහ ඒ අනුව සමාජ ශුභසාධනයට සිදුවන බලපෑම පහත ලෙස රූප සටහනකින් දැක්විය හැකිය.




I. උපරිම මිලට පෙර පාරිභෝගික අතිරික්තය = A + B + C

II. උපරිම මිලට පෙර නිෂ්පාදක අතිරික්තය = D + E + F

III. උපරිම මිලට පෙර ආර්ථික අතිරික්තය = A + B + C + D + E + F

IV. උපරිම මිලට පසු පාරිභෝගික අතිරික්තය = A ( B + C අහිමි වී ඇත)

V. උපරිම මිලට පසු නිෂ්පාදක අතිරික්තය = F ( D + E අහිමි වී ඇත)

VI.උපරිම මිලට පසු ආර්ථික අතිරික්ත = A + F

VII. අහිමි වු ආර්ථික අතිරික්තය = C + E (අහිමි ශුභසාධනය)

# අහිමි ශුභසාධනය ලබාගන්නා ආකාරය

- ඉහත රූප සටහනෙහි B+D පාරිභෝගික අතිරික්තයට එකතු කරනවාද, නැද්ද යන්න තීරණය වීම කෙරෙහි බලපාන කරුණු දෙකකි.

1 . හිඟ භාණ්ඩ ලබා ගැනීමට වැයවන කාලය හා මුදල් ප්‍රමාණය

2 . පෝලිමේ සිටීමට ගතවන කාලය

- මෙම කරුණු දෙක සඳහා අමතර පිරිවැයක් දැරීමට පාරිභෝගිකයාට සිදු නොවේ නම් B+D කොටස්වල ක්ෂේත්‍රවලයද පාරිභෝගික අතිරික්තයට එකතු වේ.

- මේ අනුව ඉහත ගණනය කරන ලද තොරතුරැද සමගින් උපරිම මිල සීමා පැනවීම පාරිභෝගිකයාට බලපෑ ආකාරය පැති දෙකකින් විග්‍රහ කළ හැකිය. එනම්

1. B+C = පාරිභෝගික අතිරික්තයේ අහිමි වීම
2. B+D = පාරිභෝගික අතිරික්තයේ සිදුවිය හැකි වැඩිවීම

- පාරිභෝගිකයාට වු බලපෑම නිෂ්පාදන අතිරික්තයෙහි සිදු වු අහිමි විම (D+E) සමග ගැළපීමෙන් අහිමි සුභසාධනය පහත ලෙස ලබාගත හැකිය.

අහිමි සුභසාධනය $= B + D - (B+C+D+E)$

$= -(C+E)$

- උපරිම මිල අර්ථවත් වන්නේ එහි අපේක්ෂිත වාසිය එලෙසින්ම පාරිභෝගිකයාට ලැබේ නම්ය.

Question

01. ඒකක භාණ්ඩයකට අදාළ තොරතුරු පහත දැක්වේ.

| මිල | ඉල්ලුම් ප්‍රමාණය | සැපයුම් ප්‍රමාණය |
|---|---|---|
| 10 | 600 | 200 |
| 20 | 200 | 400 |

I. ප්‍රස්ථාරයක ඉල්ලුම් හා සැපයුම වක්‍ර අඳින්න.

II. සමතුලිත මිල හා ප්‍රමාණය කොපමණද?

III. පාරිභෝගික අතිරික්තය, නිෂ්පාදන අතිරික්තය, ආර්ථික අතිරික්තය කොපමණද?

IV. රජය මෙම භාණ්ඩයේ උපරිම මිල රු.10ක් ලෙස නියම කරයි නම් ඇති වන අධි ඉල්ලුම කොපමණද?

V. කළු කඩයෙහි අයකළ හැකි උපරිම මිල කවරේ ද?

VI. උපරිම මිලෙන් පසු පාරිභෝගික අතිරික්තය, නිෂ්පාදන අතිරික්තය, ආර්ථික අතිරික්තය කොපමණද?

VII. අහිමි වන සුභසාධනය දක්වන්න.

- ඒ අනුව උපරිම මිල අර්ථවත් කිරීම සඳහා ගතහැකි ක්‍රියාමාර්ග කිහිපයකි.

1 . ආනයනය

2 . නිෂ්පාදකයන් දිරිගැන්වීම

3 . සලාක කිරීම

- උපරිම මිල නියම කිරීම නිසා ඇතිවන අධි ඉල්ලුම හේතුවෙන් වෙළඳපොළෙහි ඇතිවන භාණ්ඩ හිගයට පිළියම් වශයෙන් භාණ්ඩ ආනයනය කළ හැකිය. එසේ කිරීමෙන් උපරිම මිල පැනවීමේ වාසි පාරිභෝගිකයාට ලබා දිය හැකිය.

- එසේම උපරිම මිල සීමා පැනවීම නිසා අධෛර්යමත් වන නිෂ්පාදකයන් දිරිගැන්වීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමෙන්ද වෙළඳපොළෙහි ඇති වන හානි වළක්වා අපේක්ෂිත වාසිය පාරිභෝගිකයින් අතර සලාක කර බෙදා දීමට සිදුවේ.

- උපරිම මිල සීමා පැනවීම නිසා වෙළඳපොළ මිල යන්ත්‍රණය නිෂ්ක්‍රිය වන බැවින්, හිඟ භාණ්ඩ සලාක කිරිමට සිදු වන්නේ මිල නොවන මාධ්‍යයන් භාවිතා කිරීමෙන්ය. පහත දැක්වෙන්නේ සලාක කිරීම සඳහා යොදාගත හැකි එවැනි මිල නොවන මාධ්‍යයයි.

1 . සලාක පත් යොදා ගැනීම

2 . පෝලිම් ක්‍රමය

3 . අල්ලස් මගින් සලාක කිරීම

4 . වෙනත් භාණ්ඩ සමග සම්බන්ධ කොට සලාක කිරීම


5 . කළු කඩමිල

# අවම මිල සීමා නියම කිරීම

- ඉල්ලුම් සැපයුම් බලවේග මත තීරණය වූ වෙළඳපොළ මිල නිෂ්පාදකයන්ට අසාධාරණ වෙතැයි යන විශ්වාසය මත නිෂ්පාදකයන්ට සාධාරණත්වයක් සැලසීම සඳහා ආණ්ඩුව විසින් සමතුලිත මිලට ඉහළින් නීත්‍යානුකූලව නියම කරන මිල අවම මිල සීමා නියම කිරීම යන්නෙන් අදහස් වේ.
- අවම මිල සීමා පැනවීමේ අරමුණ නිෂ්පාදකයන්ට සාධාරණත්වයක් සැලසීම වන බැවින් අවම මිල සමතුලිත මිලට වඩා ඉහළින් නියම කළ යුතුය.
- සමතුලිත මිලට ඉහළින් නියම කරනු ලබන අවම මිල සඵල අවම මිල නමින් හැඳින්වේ.

නිදසුන් : වී සඳහා අවම මිලක් නියම කිරීම අවම වැටුප් අනුපාත නියම කිරීම

- පහත රූප සටහනින් දැක්වෙන්නේ අවම මිල සීමා පැනවීමකි.





- ඉහත රූප සටහනෙහි දැක්වෙන පරිදි $P_1$ අවම මිල සීමා නියම කිරීම නිසා වෙළඳපොළ සැපයුම් ප්‍රමාණය $Q - Q_2$ දක්වා වැඩි වී ඇති අතර, ඉල්ලුම් ප්‍රමාණය $Q - Q_1$ දක්වා අඩු වී ඇත.
- මෙහි ප්‍රතිඵලය වශයෙන් වෙළඳපොළෙහි $Q_2 - Q_1$ දක්වා වන අධි සැපයුමක් හටගෙන ඇත.

# අවම මිල සීමා නියම කිරීම නිසා ඇතිවන ආර්ථික ප්‍රතිවිපාක

1. අතිරික්ත නිෂ්පාදනය වෙළඳපොළෙහි ගොඩ ගැසීම හෙවත් තොග සමුච්චනය වීම.
2. සේවා සම්බන්ධයෙන් ගත් කල විරැකියාව වැනි ගැටළු මතුවීම.
3. වෙළඳුන් නීතියෙන් පලා යාමට තැත් කිරීම (අවම මිල නාමික මිලක් සේ සලකා අඩු මිලට භාණ්ඩ අලෙවි කිරීම).
4. අධි ආයෝජන තත්ත්වයක් උද්ගත වීම.
5. පාරිභෝගික අතිරික්තයට නිෂ්පාදක අතිරික්තයට බලපෑම් ඇති වි සමාජ සුභසාධනයටද බලපෑම් ඇතිවීම.

අවම මිලෙහි සුභසාධනය ප්‍රතිවිපාකයන් පහත ලෙස ප්‍රස්තාර සටහනක් මගින් දැක්විය හැකිය.




**අවම මිලට පෙර,**

පාරිභෝගික අතිරික්තය = A + B+ C

නිෂ්පාදන අතිරික්තය = D + E

ආර්ථික අතිරික්තය = A+B+C+D+E

**අවම මිලට පසු,**

පාරිභෝගික අතිරික්තය = A

නිෂ්පාදන අතිරික්තය = නිෂ්පාදකයාගේ අයභාරය - නිෂ්පාදකයාගේ විචල්‍ය පිරිවැය

(නිෂ්පාදකයා $Q_1$ සැපයීමට

තීරණය කලහොත්)

= (B+D+F) - F

= B+ D

අවම මිලට පසු ආර්ථික අතිරික්තය = A + B + D

අවම මිලට පසු නිෂ්පාදකයා = නිෂ්පාදකයාගේ අයභාරය - නිෂ්පාදකයාගේ විචල්‍ය පිරිවැය

(නිෂ්පාදකයා $Q_2$ සැපයීමට = B+D+F - (F+G+H+I)

තීරණය කලහොත්)

- මෙහිදී නිෂ්පාදකයා F+G+H+I ලෙසින් වන විචල්‍ය පිරිවැය දැරූ $Q_2$ සැපයීමට තීරණය කළ ද පාරිභෝගිකයා ඉල්ලුම් කරන්නේ $Q_1$ නිසා B+D+F ලෙසින් වන නිෂ්පාදකයාගේ අයභාරය ඔහුගේ පිරිවැයට වඩා අඩුවේ.

- මෙයින් පැහැදිලි වන්නේ නිෂ්පාදකයන්ට සාධාරණත්වය සඳහා අවම මිල සීමා පැනවීම සිදුකළත්, අපේක්ෂිත තරමේ වාසියක් නිෂ්පාදකයාට අත් නොවන බවයි.

## ❖ අවම මිල අර්ථවත් කිරීම සඳහා ගතහැකි ක්‍රියාමාර්ග

1 . අතිරික්තය ගබඩා කිරීම

2 . අතුරු නිෂ්පාදනය

3 . පවත්නා ඉල්ලුම ප්‍රවර්ධනය

4 . අපනයනය

- ඉහත ක්‍රියාමාර්ග වලට අමතරව අවම මිල අර්ථවත් කර ගැනීම සඳහා රජයක් අනුගමනය කරන සුවිශේෂ ක්‍රියාමාර්ගයක් ලෙස මිල ආධාරක ප්‍රතිපත්ති දැක්විය හැකිය.

- මිල ආධාරක ප්‍රතිපත්ති වලදී අවම මිල නිෂ්පාදකයාට ලැබෙන බව සහතික වීමක් සිදුවේ. ඒ අනුව එහිදී අවම මිල සහතික මිලක් සේ සැලකේ.

## ❖ සහතික මිල (මිල ආධාරක ප්‍රතිපත්ති)

- අවම මිල සහතික මිලක් සේ සලකමින් නිෂ්පාදකයා ආරක්ෂා කර ගනිමින් නිෂ්පාදකයන්ගේ ආදායම ඉහළ නැංවීම සඳහා රජයක් අනුගමනය කරන මිල ආධාරක ප්‍රතිපත්ති ස්වරූප දෙකකි.


1 . රජයේ මිලදී ගැනිම් සහිත මිල ආධාරක ප්‍රතිපත්ති

2 . ඌන පූර්ණ ගෙවීම් ක්‍රමය

## 01. රජයේ මිලදී ගැනිම් සහිත මිල ආධාරක ප්‍රතිපත්ති

- රජයේ මිලදී ගැනීම් සහිත මිල ආධාරක ප්‍රතිපත්ති යනු, රජය විසින් නියම කරනු ලබන අවම මිල යටතේ නිෂ්පාදකයා වෙළඳපොළට සැපයීමට කැමති මුළු භාණ්ඩ ප්‍රමාණයෙන් අවම මිල යටතේ පාරිභෝගිකයා මිලදී ගෙන ඉතිරි වන අතිරික්ත සැපයුම රජය මිලදී ගැනීමයි.

මෙලෙසින් වන අතිරික්ත සැපයුම රජය මිලට ගැනීම හා ඒ ආශ්‍රිත ඇති වන ප්‍රතිවිපාක පහත ලෙස රූප සටහනක් මගින් දැක්විය හැකිය.




මෙහිදී අවම මිල පනවා අතිරික්තය රජය විසින් මිලට ගැනීමේ සහතික මිල ක්‍රමය ක්‍රියාත්මක කරයි. ඒ අනුව 0 - $Q_1$ දක්වා ප්‍රමාණය පාරිභෝගිකයා විසින් මිලට ගනියි' Q - $Q_2$ දක්වා ප්‍රමාණය සහතික මිල යටතේ රජය විසින් මිලට ගනියි.

## සුභසාධනයේ ප්‍රතිවිපාක

සහතික මිලට පෙර, පාරිභෝගික අතිරික්තය = A + B + C

සහතික මිලට පසු පාරිභෝගික අතිරික්තය = A

පාරිභෝගික අතිරික්තයේ අඩුවීම = (A + B + C) - A

= B + C

සහතික මිලට පෙර, නිෂ්පාදක අතිරික්තය = D + E

සහතික මිලට පසු නිෂ්පාදක අතිරික්තය = B+ C + J + D + E

නිෂ්පාදක අතිරික්තයේ වැඩිවීම = B + C + J

සහතික මිල යටතේ අතිරික්තය මිලට ගැනීම වෙනුවෙන්,

රජයට දැරීමට සිදුවන පිරිවැය = C + E + G + H + K + J

පාරිභෝගිකයාගේ පැහැදම = B + D + F

නිෂ්පාදකයාගේ අයභාරය = B + C + J + D + E + F + G + H + K

ගෘහසාධනයට වූ බලපෑම = නිෂ්පාදක අතිරික්තයේ වැඩිවීම - පාරිභෝගික අතිරික්තයේ අඩුවීම + රජයේ පිරිවැය

= (B+C+J) - (B+C+ C+E+G+H+K+J)

= -(C+ E+G+H+K)


- (C+E+G+H+K) ප්‍රමාණයෙන් අතිරික්ත මිලදී ගැනීමේ මිල ආධාරක ප්‍රතිපත්තිය නිසා සමාජ ගෘහසාධනයේ අහිමි වීමක් සිදුව ඇත.



## 02. ඌන පුරණ ගෙවීමේ ක්‍රමය

- ඌන පුර්ණ ගෙවීම් ක්‍රමය යනු අවම මිල සීමාව යටතේ නිෂ්පාදකයන් වෙළඳපොළට සැපයීමට කැමැති මුළු භාණ්ඩ ප්‍රමාණයම පාරිභෝගිකයන් ගෙවීමට කැමති වෙළඳපොළ තීරණාව වන මිලත් රජය විසින් පනවන ලද අවම මිලත් අතර ප්‍රමාණය රජය විසින් නිෂ්පාදකයාට ගෙවීමයි.

ඌන පූරණ ගෙවීම් ක්‍රමය පහත ලෙස රූප සටහනක් මගින් දැක්විය හැකිය.



## සුභසාධන ප්‍රතිවිපාක

සහතික මිලට පෙර, පාරිභෝගික අතිරික්තය = A + B

සහතික මිලට පසු පාරිභෝගික අතිරික්තය= A+B+C+F+G

පාරිභෝගික අතිරික්තයේ වැඩිවීම = A+B+C+F+G - A+B

= C+F+G

සහතික මිලට පෙර නිෂ්පාදක අතිරික්තය = C + D

සහතික මිලට පසු නිෂ්පාදක අතිරික්තය = C + D + B + J

නිෂ්පාදන අතිරික්තයේ වැඩිවිම = B + J

$P_1$ සහතික මිල යටතේ නිෂ්පාදකයා වෙළඳපොලට සපයන මුළු භාණ්ඩ ප්‍රමාණය = $Q_1$

$Q_1$ සඳහා පාරිභෝගිකයා ගෙවීමට කැමති මිල හෙවත් $Q_1$ සඳහා වන වෙළඳපොළ මිල=$P_2$

ඌන පූර්ණ ගෙවීම සඳහා රජයේ පිරිවැය = B+J+C+F+G+K

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| සුභසාධනයට වූ බලපෑම | = | පාරිභෝගික අතිරික්තයේ වැඩිවීම | - | නිෂ්පාදක අතිරික්තයේ අඩුවීම | – | රජයේ පිරිවැය |

= C+F+G+B+J - (B+J+C+F+G+K)

= -K

- -K ප්‍රමාණයෙන් සමාජ ශුභසාධනයේ අහිමි වීමක් සිදුව ඇත.
- ඌන පූර්ණ ගෙවීම නිසා නිෂ්පාදකයාගේ අයභාරය = B+J+K+C+F+G+D+E+H
- පාරිභෝගික පැහැදම = D+E+H

(රජයේ පිරිවැය + පාරිභෝගික පැහැදම = නිෂ්පාදක අයභාරය) වේ.

- නිෂ්පාදිත භාණ්ඩවල මිල ගණන් නිතර නිතර උච්චාවචනය විම මිල අස්ථායිතාවයක් ලෙස සැලකේ. මිල ගණන් අස්ථායි වනවිට නිෂ්පාදකයන්ගේ ආදායම්හි ද අස්ථායීතාවයන් ඇතිවේ.

- විශේෂයෙන්ම කෘෂිකාර්මික භාණ්ඩවල මිල ගණන් නිතර උච්චාවචනය වීම ප්‍රායෝගික ලෝකයේ සුලභව දැකිය හැකි කරුණකි. කෘෂි භාණ්ඩවල මිල ගණන් උච්චාවචනය නිරන්තරයෙන් සිදුවන විට ගොවින්ගේ ආදායම් අස්ථායී වීම ප්‍රබල ගැටළුවක් වී ඇත.

- මෙබඳු අවස්ථාවන්හි දී වගා කරුවන්ගේ ආදායම් ස්ථායි කිරීම සඳහා ආණ්ඩුවක් විසින් විවිධාකාර වු මිල ස්ථායීකරණ වැඩ පිළිවෙලවල් ක්‍රියාත්මක කරනු දක්නට ලැබේ.

- නිෂ්පාදකයන් මත සලාක නියම කිරීම, තොග රැස් කිරීම හා මුදා හැරීම, ඉඩම් වගා කරන ප්‍රමාණය සීමා කිරීම, ආනයන තීරු බදු පැනවීම, ආනයන සලාක කිරීම, අභිමතය පරිදි ආනයන සීමා කිරීම වැනි ක්‍රියා මාර්ග මිල ස්ථායිකරණය සඳහා යොදා ගනු ලබයි.

- නිෂ්පාදකයන් මත සලාක නියම කිරීම ඒ අතර වැදගත් වන ස්ථායිකරණ වැඩපිළිවෙලකි. කිසියම් නිශ්චිත කාලයක් තුළ නිපදවිය හැකි නිමවුම් ප්‍රමාණය පිළිබඳ උපරිම සීමාවන් ආණ්ඩුව විසින් නියම කිරීම නිෂ්පාදන සලාක කිරීම යන්නෙන් අදහස් කෙරේ.

- වෙළඳපොළට ළගා වන සැපයුම සීමා කරමින් මිල ඉහළ මට්ටමක පවත්වා ගෙන යාමට මෙමගින් අපේක්ෂා කෙරේ.

01. තරගකාරී වෙළඳපොළක ඇති එක්තරා භාණ්ඩයක පහත තොරතුරු දැක්වේ.

| මිල | ඉල්ලුම් ප්‍රමාණය | සැපයුම් ප්‍රමාණය |
|---|---|---|
| 100 | 300 | 400 |
| 50 | 400 | 100 |

❖ ඉල්ලුම් සැපයුම් වක්‍ර ප්‍රස්තාර සටහනක දක්වා සමතුලිත මිල හා ප්‍රමාණය දක්වන්න.

❖ පාරිභෝගික අතිරික්තය, නිෂ්පාදන අතිරික්තය, ආර්ථික අතිරික්තය කොපමණද?

❖ මෙම භාණ්ඩය සඳහා රු.140 ක අවම මිලක් නියම කර අතිරික්ත සැපයුම රජය විසින් මිලදී ගනියි නම්,

1 . එහිදී ඇති වන අතිරික්ත සැපයුම

2 . පාරිභෝගික අතිරික්තය

3 . නිෂ්පාදන අතිරික්තය

4 . රජයේ පිරිවැය

5 . සුභසාධන පිරිවැය

කොපමණද?

❖ 02. තරඟකාරී වෙළඳපොළක ඇති එක්තරා භාණ්ඩයක පහත තොරතුරු දැක්වේ.

| මිල | ඉල්ලුම් ප්‍රමාණය | සැපයුම් ප්‍රමාණය |
|---|---|---|
| 100 | 300 | 400 |
| 50 | 400 | 100 |

❖ ඉල්ලුම් සැපයුම් වක්‍ර ප්‍රස්තාර සටහනක දක්වා සමතුලිත මිල හා ප්‍රමාණය දක්වන්න.

❖ පාරිභෝගික අතිරික්තය, නිෂ්පාදන අතිරික්තය, ආර්ථික අතිරික්තය කොපමණද?

❖ මෙම භාණ්ඩය සඳහා රු. 140 ක අවම මිලක් නියම කර ඌණ පූර්ණ ගෙවීමේ ක්‍රමය හඳුන්වා දුනි නම් පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

❖ එහිදී වෙළඳපොළ මිල

❖ පාරිභෝගික අතිරික්තය

❖ නිෂ්පාදන අතිරික්තය කොපමණද?

❖ රජයේ පිරිවැය (මුළු ඌණ පූර්ණ ගෙවීම)

❖ සුභසාධන පිරිවැය කොපමණද?

ආදරණීය දුවේ පුතේ මෙය උසස් පෙළ ගුරු මාර්ගෝපදේශකය ඇසුරින් සකස් කරන ලද්දකි.

විෂය පෝෂණය සඳහා මීට අමතරව, අතිරේක කියවීම්, කාලීන ආර්ථික සිදුවීම් හා සංඛ්‍යා ලේඛන පිළිබඳව යාවත්කාලීන දැනුම ඔබ විසින් ලබාගත යුතුය.

